වේවැල්, පිත්තල, මැටි, ලී බඩු සහ ග්‍රාමීය කර්මාන්ත ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය
பிரம்புகள், பித்தளை, மட்பாண்டங்கள், மரப்பொருட்கள் மற்றும் கிராமியக் கைத்தொழில் மேம்பாட்டு இராஜாங்க அமைச்சு
**State Ministry of Rattan, Brass, Pottery, Furniture and Rural Industrial Promotion**

| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இல:<br>My No. | SMRIP/ES/01/06/අභ්‍යන්තර චක්‍රලේඛ | ඔබේ අංකය<br>உமது இல:<br>Your No. | | දිනය<br>திகதி<br>Date | 2022.02.07 |

අමාත්‍යාංශ චක්‍රලේඛ : **03/2022**

සියළුම දිස්ත්‍රික් ලේකම්වරුන්,
සියළුම ප්‍රාදේශීය ලේකම්වරුන්,
සියළුම දිස්ත්‍රික් විදාතා නිලධාරීන් / සියළුම මධ්‍යස්ථාන භාර විද්‍යා හා තාක්ෂණ නිලධාරීන් / සංවර්ධන නිලධාරීන්
වෙත.

## කර්මාන්ත ව්‍යවසායකයන් සඳහා තාක්ෂණික සායනික සත්කාර වැඩසටහන.

## 01. හැඳින්වීම

රජයේ ජාතික ප්‍රතිපත්ති රාමුව, රට හදන සෞභාග්‍යයේ දැක්මට හා තිරසර සංවර්ධන ප්‍රතිපත්ති වලට අනුව ජනතා කේන්ද්‍රීය ආර්ථිකයක් ලඟා කර ගැනීම වෙනුවෙන් ග්‍රාමීය කර්මාන්ත ප්‍රවර්ධනය කිරීම වේවැල්, පිත්තල, මැටි, ලී බඩු සහ ග්‍රාමීය කර්මාන්ත ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශයේ ප්‍රමුඛ කාර්යයක් වේ. ඒ අනුව ග්‍රාමීය කර්මාන්තකරුවන්ගේ කර්මාන්තවල ගැටළු නිරාකරණය සඳහා උපදෙස් ලබා දීම සහ නිෂ්පාදනය ප්‍රවර්ධනය සඳහා අවශ්‍ය සේවාවන් සැපයීම තුලින් වඩාත් ඵලදායී නිමි භාණ්ඩයක් බිහි කිරීමේ අරමුණින් මෙම වසරේ ද අමාත්‍යාංශය විසින් උක්ත වැඩසටහන පැවැත්වීමට අපේක්ෂා කරයි.
මේ සඳහා,

1. කාර්මික තාක්ෂණ ආයතනය (ITI)
2. ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය (SLSI)
3. ජාතික ඉංජිනේරු පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය (NERD)
4. ජාතික ශිල්ප සභාව (NCC)
5. අපනයන සංවර්ධන මණ්ඩලය (EDB)
6. කාර්මික සංවර්ධන මණ්ඩලය (IDB) යන ආයතන සම්පත්දායක ආයතන වශයෙන් සහභාගි වේ.

## 02. වැඩසටහනේ අරමුණු

2.1 නිෂ්පාදන ක්‍රියාවලිය ප්‍රශස්ථ මට්ටමට පත් කිරීම

2.2 නිෂ්පාදන ක්‍රියාවලිය කාර්යක්ෂම කිරීම.

2.3 නිෂ්පාදනයේ ගුණාත්මකභාවය සනාථ කිරීම

2.4 නිෂ්පාදන ක්‍රියාවලියේදී පාරිසරික සංරක්ෂණය සහතික කිරීම



Level 07
West Tower
World Trade Centre
Echelon Square
Colombo 01

07 වන මහල
බටහිර කුළුණ
ලෝක වෙළඳ මධ්‍යස්ථානය
එචිලන් චතුරශ්‍රය
කොළඹ 01

Tel :+(94) 112 437 805
Tel :+(94) 112 437 828
Fax :+(94) 112 437 823

## 03. වැඩසටහන් කළමනාකරණය

විද්‍යාතා තාක්ෂණික සායනික සත්කාර වැඩසටහන පැවැත්වීමේ දී පහත ක්‍රමවේදය අනුගමනය කරන ලෙස දන්වා සිටිමි.

- 2022 වසරේ දී විද්‍යාතා සායනික සත්කාර වැඩසටහනක් පැවැත්වීමේ වගකීම දිස්ත්‍රික් විද්‍යාතා නිලධාරි වෙත පැවරේ.
- එක් එක් දිස්ත්‍රික්කය සඳහා සායනික වැඩසටහන් පහත සඳහන් දිනයන්හි පැවැත්වීමට සැළසුම් කර ඇත.

| දිස්ත්‍රික්කය | දිනය (මාර්තු) | දිස්ත්‍රික්කය | දිනය (අප්‍රේල්) | දිස්ත්‍රික්කය | දිනය (මැයි) |
|---|---|---|---|---|---|
| කොළඹ | 4 | හම්බන්තොට | 1 | කුරුණෑගල | 5 |
| රත්නපුර | 9 | | | මොණරාගල, අම්පාර | 12,13 |
| කෑගල්ල | 11 | පොළොන්නරුව | 7 | මඩකලපුව | |
| | | | | යාපනය,වවුනියා, | |
| මහනුවර | 15 | | | මුලතිවු | 19 |
| මාතලේ | 16 | ත්‍රිකුණාමලය | 8 | මන්නාරම,කිලිනොච්චිය | |
| පුත්තලම | 24 | | | | |
| අනුරාධපුර | 25 | නුවරඑළිය | 28 | ගම්පහ | 24 |
| ගාල්ල | 29 | | | | |
| මාතර | 31 | බදුල්ල | 29 | කළුතර | 26 |

- වැඩසටහන පැවැත්වීම සිදුකරන ආකාරය පිළිබඳව (දිස්ත්‍රික්කයට පැමිණ හෝ මාර්ගගතවද යන්න) ඉහත අදාළ දිනයට සති 2 කට පෙර දිස්ත්‍රික් විද්‍යාතා නිලධාරි විසින් අමාත්‍යාංශය දැනුවත් කළ යුතුය.
- අමාත්‍යාංශය විසින් පර්යේෂණ ආයතන සමග සාකච්ඡා කර අදාළ යෝජිත දිනට එම ආයතන දිස්ත්‍රික්කයට සායනික සත්කාර වැඩසටහන පැවැත්වීම සඳහා සහභාගි කිරීමට කටයුතු කරනු ඇත.
- දිස්ත්‍රික්කයේ සියළුම විද්‍යා හා තාක්ෂණ නිළධාරීන්/ සංවර්ධන නිලධාරීන් විසින් තම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ සායනික සත්කාර වැඩසටහන සඳහා ග්‍රාමීය කර්මාන්තකරුවන් හඳුනා ගැනීමේ දී දැනටමත් ගෘහස්ථ මට්ටමින් හෝ කර්මාන්තයක යෙදී ඇති ව්‍යවසායකයින් හඳුනා ගත යුතුය.
- වැඩසටහන සඳහා සම්බන්ධ වන සම්පත්දායක ආයතනවලට යොමු කිරීමට ගැටළු තිබෙන කර්මාන්තකරුවන් හඳුනා ගෙන ඔවුන්ව අදාළ ආයතනවලට යොමු කිරීමට කණ්ඩායම් වශයෙන් වෙන් වෙන්ව හඳුනා ගැනීම වැදගත් වේ.
- දිස්ත්‍රික් විද්‍යාතා නිළධාරි විසින් විද්‍යා හා තාක්ෂණ නිළධාරීන්/ සංවර්ධන නිලධාරීන්ගේ සහායද සහිතව සායනික සත්කාර වැඩසටහන Covid 19 වසංගත තත්වය හේතුවෙන් පනවා ඇති සෞඛ්‍ය නීති රීති අනුගමනය කරමින් සංවිධානය කළ යුතුය.
- සායනික අවස්ථාවේදී සම්පත්දායක ආයතනය සමග කටයුතු කිරීම සඳහා දිස්ත්‍රික් විද්‍යාතා නිලධාරි විසින් විද්‍යා හා තාක්ෂණ නිළධාරියකු/ සංවර්ධන නිලධාරියෙකු බැගින් පත් කළ යුතුය.
- වැඩසටහනට සහභාගි වන කර්මාන්තකරුවන් වෙත A පෝරමය (ඇමුණුම 1) ලබා දී ඔවුන්ට අදාළ තොරතුරු සම්පූර්ණ කරන ලෙස දැනුම් දිය යුතුය.
- සම්පත්දායක ආයතන විසින් තම ආයතනයේ සේවාවන් පිළිබඳව පොදුවේ කර්මාන්තකරුවන් දැනුවත් කරනු ඇත.

- අනතුරුව සම්පත් දායක ආයතන සහ අදාළ විද්‍යා හා තාක්ෂණ නිළධාරී/ සංවර්ධන නිලධාරි සම්බන්ධවී සායනික සැසිය ආරම්භ කළ යුතුය.

- ඉන්පසු කර්මාන්තකරුවන් තම නිෂ්පාදන ක්ෂේත්‍රය සහ තමාගේ ගැටළුව අනුව තමාට අදාළ සම්පත්දායක ආයතනය වෙත යොමු කර ( A පෝරමයද සමග) ඔවුන්ගේ කර්මාන්ත ප්‍රවර්ධනයට අදාළ ගැටළු හඳුනා ගැනීම සහ ගත යුතු ඉදිරි ක්‍රියා මාර්ග A පෝරමයේ සටහන් කළ යුතුය.

- වැඩසටහන අවසානයේ සම්පූර්ණ කරන ලද A පෝරම, ව්‍යවසායකයා අයත් වන විද්‍යාතා සම්පත් මධ්‍යස්ථානයේ විද්‍යා හා තාක්ෂණ නිළධාරී/ සංවර්ධන නිලධාරි විසින් ලබා ගෙන එම තොරතුරු B ආකෘතියට (ඇමුණුම 2) අනුව සකස් කර සතියක් ඇතුලත දිස්ත්‍රික් විද්‍යාතා නිළධාරී වෙත ලබා දිය යුතුය.

- දිස්ත්‍රික් විද්‍යාතා නිළධාරී මගින් සියළුම විද්‍යාතා සම්පත් මධ්‍යස්ථානවලින් ලබාගත් තොරතුරු C ආකෘතියේ (ඇමුණුම 3) ඇතුලත් කර සති දෙකක් තුල අමාත්‍යාංශය වෙත ලබා දිය යුතුය. (C ආකෘතිය ආයතන හයට වෙන් වෙන් වශයෙන් පිරවිය හැකි ආකාරයට අමාත්‍යාංශයෙන් ලබා දෙන සබැඳිය හරහා සම්පූර්ණ කළ යුතුය. )

  *මෙහිදී කර්මාන්තකරුට අදාළ ආයතනයෙන් ලබා ගැනීමට අවශ්‍ය සේවාව/ සහතිකය නිශ්චිතව සඳහන් කළ යුතුය. (උදා:- ආහාර තාක්ෂණය නම් අදාළ නිෂ්පාදනය යෝගට්/ පළතුරු බීම/ තල කැරලි ආදී වශයෙන් නිෂ්චිත විය යුතු අතර එම ආයතනයට අදාළ විය යුතුය.)

- අමාත්‍යාංශය විසින් එම තොරතුරු අදාළ ආයතන වෙත යොමු කර වියදම් ඇස්තමේන්තු කැඳවා අදාළ පසුවිපරම් වැඩසටහන් සම්බන්ධීකරණය කළ යුතුය. (ආයතන හා දිස්ත්‍රික් විද්‍යාතා නිලධාරි සමග ඇමුණුම 4 හි ගූගල් ෂීට් මගින් මෙය සිදු කෙරේ.)

- 2021 වර්ෂයේ හා 2022 වර්ෂයේ සායනික සත්කාර වැඩසටහන් තුලින් අදාළ ආයතන හරහා කර්මාන්තකරුවන්ගේ තාක්ෂණ ගැටළු විසඳීමෙන් / අදාළ තත්ත්ව පරීක්ෂණ වාර්තා ලබා දීමෙන් / ප්‍රමිති සහතික ලබා දීමෙන්/ නව තාක්ෂණයන් හඳුන්වා දීමෙන් අනතුරුව පසු අධීක්ෂණය හා සුපිරි වෙළඳසැල් ජාලය සමග කර්මාන්තකරුවන් සම්බන්ධ කරවීම හා අපනයන වෙළඳපොළ සඳහා සුදුසු විභවයක් පවතින කර්මාන්තකරුවන් ඒ සඳහා යොමු කරවීමට අදාළ සම්බන්ධීකරණ කටයුතු දිස්ත්‍රික් විද්‍යාතා නිලධාරි විසින් සිදු කළ යුතුය.

- 2022 වසර සඳහා දිස්ත්‍රික් සායනික වැඩසටහන් සංවිධානය කිරීමට යොදා ඇති දිනයට පෙර 2021 වසර සඳහා පවත්වා ඇති සායනික සත්කාර වැඩසටහනට අදාළ C ආකෘතිය භාර දිය යුතුය.

- වැඩසටහන පවත්වන දිනයට අදාළ කාර්තුව, අවසන් වීමට පෙර ප්‍රතිපාදන වියදම් කළ යුතුය.

## 04. වැඩසටහනේ ක්‍රියාත්මක කාල රාමුව

4.1 විද්‍යාතා සායනික සත්කාර වැඩසටහන පැවැත්වීම පිළිබඳව දිස්ත්‍රික් විද්‍යාතා නිලධාරීන් සහ මධ්‍යස්ථානභාර නිලධාරීන් වෙත අමාත්‍යාංශය විසින් උපදෙස් මාලාවක් ලබා දීම.- පෙබරවාරි 10 වන දිනට පෙර අවසන් කිරීම

4.2 වැඩසටහන සඳහා ප්‍රතිපාදන වෙන් කිරීම. - මැයි 31 වන දිනට පෙර අවසන් කිරීම

4.3 දිස්ත්‍රික් මට්ටමින් සායනික සත්කාර වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.- මැයි 31 වන දිනට පෙර අවසන් කිරීම

4.4 වැඩසටහන පවත්වා සති 2ක් තුල කර්මාන්තකරුවන්ට අවශ්‍ය සහයෝගය පිළිබඳ දිස්ත්‍රික් විදාතා නිලධාරි විසින් අමාත්‍යාංශය වෙත දැනුම් දීම. - ජුනි 15 වන දිනට පෙර අවසන් කිරීම

4.5 ආයතනවල ඇස්තමේන්තු අමාත්‍යාංශය වෙත ගෙන්වා ගැනීම. - ජුලි 31 වන දිනට පෙර අවසන් කිරීම

4.6 ඇස්තුමේන්තුවට අදාළ ගෙවීම්- අගෝස්තු 15 වන දිනට පෙර අවසන් කිරීම

4.7 පසු විපරම් කිරීම සහ ආයතන මගින් ප්‍රගතිය අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කිරීම. - ඔක්තෝම්බර් 31 වන දිනට පෙර අවසන් කිරීම

## 05. පැහැදිලි කර ගැනීම

මෙම චක්‍රලේඛය පිලිබඳ කිසියම් පැහැදිලි කරගැනීමක් අවශ්‍ය වන්නේ නම් අමාත්‍යාංශයේ සහකාර අධ්‍යක්ෂ (විදාතා) II, ජයසමරා ගුණරත්න මෙනෙවිය, දූරකථන අංක 011-2331356 ඔස්සේ විමසන ලෙස කාරුණිකව දන්වමි.

එම්.ජේ.බී.වී. බණ්ඩාරනායක
ලේකම්
වේවැල්, පිත්තල, මැටි, ලී බඩු සහ ග්‍රාමීය කර්මාන්ත ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය

පිටපත් :

01. ජනාධිපති ලේකම්
02. අග්‍රාමාත්‍ය ලේකම්
03. ලේකම් මුදල් අමාත්‍යාංශය
04. ලේකම් කර්මාන්ත අමාත්‍යාංශය
05. ලේකම්, ස්වදේශ කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය
06. ලේකම්, ආර්ථික පුනර්ජීවනය හා දරිද්‍රතාව තුරන් කිරීම සඳහා වන ජනාධිපති කාර්ය සාධක බලකාය
07. විගණකාධිපති, විගණකාධිපති දෙපාර්තුමේන්තුව
08. අධ්‍යක්ෂ ජනරාල්, ජාතික අයවැයදෙපාර්තුමේන්තුව
09. අධ්‍යක්ෂ ජනරාල්, භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව
10. අධ්‍යක්ෂ ජනරාල්, ජාතික සැලසුම් දෙපාර්තමේන්තුව
11. අධ්‍යක්ෂ ජනරාල්, කාර්මික තාක්ෂණ ආයතනය
12. අධ්‍යක්ෂ ජනරාල්,ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය
13. අධ්‍යක්ෂ ජනරාල්, ජාතික ඉංජිනේරු පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය (NERD)
14. අධ්‍යක්ෂ,ජාතික ශිල්ප සභාව (NCC)
15. අධ්‍යක්ෂ ජනරාල්, අපනයන සංවර්ධන මණ්ඩලය (EDB)
16. කාර්මික සංවර්ධන මණ්ඩලය (IDB)

## A පෝරමය

1. විද්‍යාත්මක සම්පත් මධ්‍යස්ථානයේ නම : ....................................................................
2. විද්‍යාත්මක සම්පත් මධ්‍යස්ථානයේ දුරකථන අංකය : ....................................................................
3. කර්මාන්ත කරුගේ නම : ....................................................................
4. කර්මාන්ත කරුගේ ලිපිනය : ....................................................................

   ....................................................................

5. කර්මාන්ත කරුගේ දුරකථන අංකය : ....................................................................
6. නිෂ්පාදන ක්ෂේත්‍රය : ....................................................................
7. ගැටළුව : ....................................................................

   ....................................................................

8. ව්‍යාපාර ප්‍රවර්ධනය සඳහා ආයතනික යෝජනාව : ....................................................................
   - ➢ ආයතනයේ නම : ....................................................................
   - ➢ යෝජනාව : ....................................................................

     ....................................................................

9. විද්‍යා හා තාක්ෂණ නිළධාරීගේ නිර්දේශය : ....................................................................

   ....................................................................

7. කර්මාන්ත කරුගේ අත්සන : ....................................................................

ඇමුණුම 2

## B ආකෘතිය

| | A | B | C | D | E | F | G* |
|---|---|---|---|---|---|---|---|
| | සම්බන්ධ කළ යුතු සම්පත් දායක ආයතනය | විද්‍යාත සම්පත් මධ්‍යස්ථානයේ නම | විද්‍යාත සම්පත් මධ්‍යස්ථානයේ දුරකථන අංකය | කර්මාන්ත කරුගේ නම | කර්මාන්ත කරුගේ ලිපිනය සහ දුරකථන අංකය | නිෂ්පාදන ක්ෂේත්‍රය | ග්‍රාමීය කර්මාන්තකරුගේ ව්‍යාපාර ප්‍රවර්ධනය සඳහා සිදුකළ යුතු ඉදිරි ක්‍රියාකාරකම පිළිබඳ ආයතනික නිර්දේශය |
| 1 | | | | | | | |
| 2 | | | | | | | |
| 3 | | | | | | | |
| 4 | | | | | | | |

* G තීරුවෙහි අවශ්‍ය තාක්ෂණ පුහුණු වැඩසටහන නම් වශයෙන් සහ අනෙකුත් සේවාවන් පැහැදිළිව සඳහන් විය යුතුයි.

මෙම ආකෘතියේ සම්පූර්ණ කරන ලද මෘදු පිටපතද අමාත්‍යාංශයේ විෂය භාර නිළධාරිය හට ලබා දිය යුතුයි

ඇමුණුම 3

## C ආකෘතිය

කාර්මික තාක්ෂණ ආයතනයේ සහය අවශ්‍ය ව්‍යවසායකයින්

| විද්‍යාතා සම්පත් මධ්‍යස්ථානය / මධ්‍යස්ථානයේ දූ.ක./ භාර නිලධාරිගේ දූ. ක. | කර්මාන්තකරුගේ නම | දුරකතනඅංකය | නිෂ්පාදන (ය) | අවශ්‍ය තාක්ෂණය / තත්ත්ව පරීක්ෂණ වාර්තා |
|---|---|---|---|---|
| | | | | |
| | | | | |

ජාතික ඉංජිනේරු පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානයේ සහය අවශ්‍ය ව්‍යවසායකයින්

| විද්‍යාතා සම්පත් මධ්‍යස්ථානය / මධ්‍යස්ථානයේ දූ.ක./ භාර නිලධාරිගේ දූ. ක. | කර්මාන්තකරුගේ නම | දුරකතනඅංකය | නිෂ්පාදන (ය) | අවශ්‍ය තාක්ෂණය |
|---|---|---|---|---|
| | | | | |
| | | | | |

ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයේ සහය අවශ්‍ය ව්‍යවසායකයින්

| විද්‍යාතා සම්පත් මධ්‍යස්ථානය / මධ්‍යස්ථානයේ දූ.ක./ භාර නිලධාරිගේ දූ. ක. | කර්මාන්තකරුගේ නම | දුරකතනඅංකය | නිෂ්පාදන (ය) | අවශ්‍ය සහතිකකරණය |
|---|---|---|---|---|
| | | | | |
| | | | | |
| | | | | |

කාර්මික සංවර්ධන මණ්ඩලයේ සහය අවශ්‍ය ව්‍යවසායකයින්

| විදාතා සම්පත් මධ්‍යස්ථානය / මධ්‍යස්ථානයේ දු.ක./ භාර නිලධාරිගේ දු. ක. | කර්මාන්තකරුගේ නම | දුරකතන අංකය | නිෂ්පාදන (ය) | අවශ්‍ය තාක්ෂණය |
|---|---|---|---|---|
| | | | | |
| | | | | |
| | | | | |

අපනයන සංවර්ධන මණ්ඩලයේ සහය අවශ්‍ය ව්‍යවසායකයින්

| විදාතා සම්පත් මධ්‍යස්ථානය / මධ්‍යස්ථානයේ දු.ක./ භාර නිලධාරිගේ දු. ක. | කර්මාන්තකරුගේ නම | දුරකතන අංකය | නිෂ්පාදන (ය) | අවශ්‍ය පුහුණුව / සේවාව |
|---|---|---|---|---|
| | | | | |
| | | | | |
| | | | | |

ජාතික ශිල්ප සභාවේ සහය අවශ්‍ය ව්‍යවසායකයින්

| විදාතා සම්පත් මධ්‍යස්ථානය / මධ්‍යස්ථානයේ දු.ක./ භාර නිලධාරිගේ දු. ක. | කර්මාන්තකරුගේ නම | දුරකතන අංකය | නිෂ්පාදන (ය) | අවශ්‍ය තාක්ෂණය / වෙළඳපොළ |
|---|---|---|---|---|
| | | | | |
| | | | | |
| | | | | |

ඇමුණුම 4

............................................ සහය අවශ්‍ය ව්‍යවසායකයින්

දිස්ත්‍රික්කය -

| විද්‍යාතා සම්පත් මධ්‍යස්ථානය / මධ්‍යස්ථාන යේ දු.ක./ භාර නිලධාරිගේ දු. ක.. | කර්මාන් තකරු ගේ නම | දුරකතන අංකය | නිෂ්පාදන (ය) | අවශ්‍ය තාක්ෂණය / සහතිකකරණ /ය වෙළඳපොළ | ඇස්තමේන්තුග ත මුදල / ගෙවා නැත/ඇත | ලබා දුන් සහයෝගය වර්තමාන ) තත්ත්වය පිළිබඳ (විස්තරය |
|---|---|---|---|---|---|---|
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |